# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2009 අංක 17 දරන හර බදු
# (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 මාර්තු මස 31 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 අප්‍රේල් මස 03 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**
**ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක්
වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 4.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

**2009 අංක 17 දරන හර බදු**
**(සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2009 මාර්තු මස 31 වන දින]

එල්.ඩී.—ඕ. 56/2008.

**2002 අංක 16 දරන හර බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2009 අංක 17 දරන හර බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 16 දරන හර බදු පනතේ 10 වන වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීම මගින් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 2002 අංක 16 දරන පනතේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(3) (අ) යම් වාණිජ බැංකුවක්, විශේෂිත බැංකුවක්, මුදල් සමාගමක් හෝ බලයලත් වෙළෙන්දකු -

(i) ප්‍රමාණවත් මුදල් ඇති යම් ජංගම හෝ ඉතිරි කිරීමේ ගිණුමකින් 6 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හර බද්ද අස්කර ගැනීම හෝ ප්‍රේෂණය කිරීම පැහැර හරින අවස්ථාවක ;

(ii) 6 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ අවස්ථාවෝචිත පරිදි, තැන්පතු සහතිකයක් හෝ සංචාරක චෙක්පතක් මුදල් කිරීමේ දී උපලබ්ධ වන මුදල් ප්‍රමාණයෙන් හර බද්ද අඩු කිරීම හෝ ප්‍රේෂණය කිරීම පැහැර හරින අවස්ථාවක,

එම වාණිජ බැංකුව, විශේෂිත බැංකුව, මුදල් සමාගම හෝ බලයලත් වෙළෙන්දා, ගෙවිය යුතු සම්පූර්ණ හර බදු ප්‍රමාණය සඳහා ගෙවීම පැහැර හැර ඇත්තකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(ආ) අවස්ථාවෝචිත පරිදි, එසේ අස්කර නොගත්, අඩු කරනු නොලැබූ හෝ ප්‍රේෂණය කරනු නොලැබූ සම්පූර්ණ මුදල කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතුව

2—PL 003770 -3,500 (2009/03)

තිබූ දිනයට පසුව එළඹෙන දිනයේ සිට එකී සම්පූර්ණ මුදල ගෙවීම පැහැර හැර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, එම සම්පූර්ණ මුදල මේ පනතේ විධිවිධාන සලසා ඇති ආකාරයට එම වාණිජ බැංකුවෙන්, විශේෂිත බැංකුවෙන්, මුදල් සමාගමෙන් හෝ බලයලත් වෙළෙන්දාගෙන් අයකර ගත යුතු ය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් හර බදු ප්‍රමාණය, අදාළ වාණිජ බැංකුවෙන්, විශේෂිත බැංකුවෙන්, මුදල් සමාගමෙන් හෝ බලයලත් වෙළෙන්දාගෙන් සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් අය කර ගැනීම සඳහා නැතහොත් එකී මුදල ඉල්ලා අස්කර ගත යුතුව තිබූ හෝ අඩු කරගත යුතුව තිබූ තැනැත්තාගෙන් සම්පූර්ණයෙන් අය කර ගැනීම සඳහා සුදුසු යයි කොමසාරිස් ජනරාල්වරයා විසින් සලකනු ලබන පියවර ගැනීමෙන් කොමසාරිස් ජනරාල්වරයා වලක්වනු ලබන පරිදි මේ වගන්තියේ සඳහන් කිසිවක් කියවා තේරුම් නොගත යුතු ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.